# දහම් පාසල් අධ්‍යාපනයේ පසුබිම, ආරම්භය සහ ව්‍යාප්තිය


මහින්දාගමනය මෙරට ආගමික සාමාජික සහ සංස්කෘතික ක්ෂේත්‍රයන්හි පමණක් නොව අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ද මහත් වෙනසකට හේතු විය. අනුරාධපුර මහමෙව්නා උයනෙහි මිහිඳු මහරහතන් වහන්සේගේ පුරෝගාමීත්වයෙන් ආරම්භ කරන ලද මහා විහාරය ලක්දිව ප්‍රථම විහාරස්ථානය මෙන් ම ප්‍රථම අධ්‍යාපන මධ්‍යස්ථානය ද වශයෙන් හැඳින්විය හැකිය. බුදු දහම පිළිබඳව ශ්‍රී



ථේරවාද බුදුසමයේ කේන්ද්‍රස්ථානය වූ අනුරාධපුර මහා විහාරය

ලාංකිකයන් තුළ පැවති ප්‍රබෝධයත් රාජ්‍ය අනුග්‍රහයත් නිසා බුදුසසුන සීඝ්‍රයෙන් පැතිර යාමත් සමඟ දිවයින පුරා විහාරස්ථාන ඉදි වූ අතර සෑම ගමකම පාහේ පන්සලක් ආරම්භ විය. එය ගමේ මධ්‍යස්ථානය වූ අතර ධර්ම විනය, භාෂා ශාස්ත්‍රය, වෛද්‍ය ශාස්ත්‍රය, ජ්‍යොතිෂය, ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍ර, මූර්ති, කැටයම් ආදී කලා ශිල්පද මෙම අධ්‍යාපන ආයතනයෙහි උගන්වනු ලැබිණි. දිවයින පුරා ව්‍යාප්තව පැවති දහස් සංඛ්‍යාත මෙම අධ්‍යාපන ආයතන අතරින් ඇතැම් ඒවා උසස් අධ්‍යාපනය ලබා දෙන ආයතන බවට පත් වූ අතර ඒවා පසු කාලයෙහි පිරිවෙන් නමින් ප්‍රකට විය.


16 වැනි සියවසේදී පෘතුගීසීන් ලංකාවට පැමිණෙන අවස්ථාව වන විට නූතන විශ්වවිද්‍යාලයන්ට සමාන පිරිවෙන් 6 ක් දිවයිනේ විවිධ ප්‍රදේශ වල පැවති බව සංදේශ සාහිත්‍යයෙන් හෙළි වේ. පෘතුගීසි, ලන්දේසි පාලන කාල වලදී බෞද්ධ විහාරස්ථානයන්ට සහ මහා සංඝයා වහන්සේට එල්ල වූ තර්ජන නිසා බෞද්ධ අධ්‍යාපනය පමණක් නොව බුදු සසුනද පරිහානියට පත් විය. වැලිවිට සරණංකර සඟරජ මාහිමි පහළ වන අවදිය වන විට උපසම්පදා භික්ෂුනමක් නොමැති තත්වයට මෙරට සංඝ සමාජය පත්ව තිබීමෙන් එම ඛේදජනක පරිහානිය කෙතරම්ද යන්න අවබෝධ කරගත හැකිය. සරණංකර සාමණේර හිමියෝ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේද පූර්ණ අනුග්‍රහය ඇතිව සියම් රටෙන් උපසම්පදා භික්ෂූන් වහන්සේලා වැඩම කරවා ක්‍රි.ව. 1753 දී නැවත ලංකාවේ උපසම්පදාව ඇති කළ සේක.




වැලිවිට සරණංකර හිමි

සංඝරාජ මාහිමිපාණන්ගෙන් ඇරඹුණු ධර්ම ශාස්ත්‍රෝන්නතියේ ප්‍රතිඵලයක් වශයෙන් උන්වහන්සේගේ ශිෂ්‍ය සිටිනාමළුවේ ධම්මජෝති හිමිපාණන්ගේ ශිෂ්‍ය වේලැල්ලේ ධම්මදින්න හිමිපාණන් විසින් පැල්මඩුල්ල රජමහා විහාරස්ථානයෙහි ආරම්භ කරන ලද ශාස්ත්‍ර ශාලාව නූතන බෞද්ධ අධ්‍යාපනයේ නවෝදයකට හේතුවිය. පැල්මඩුල්ල ශාස්ත්‍ර ශාලාවේ ශාස්ත්‍රෝද්ග්‍රහණය කළ වලානේ ශ්‍රී සිද්ධාර්ථ මාහිමිපාණන් විසින් රත්මලානේ පරමධම්මචේතිය විහාරයෙහි (වර්තමාන පරම ධම්මචේතිය පිරිවෙන) ආරම්භ කරන ලද ශාස්ත්‍ර ශාලාව මෙරට වර්තමාන පිරිවෙන් අධ්‍යාපනයේ සමාරම්භය සේ සැළකිය හැකිය. පරමධම්මචේතිය ශාස්ත්‍ර ශාලාවේ අධ්‍යාපනය හැදෑරූ පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් විසින් 1873 දී විද්‍යෝදය පිරිවෙනද, පූජ්‍ය රත්මලානේ ශ්‍රී ධම්මාලෝක නාහිමිපාණන් විසින් 1875 දී විද්‍යාලංකාර පිරිවෙනද ආරම්භ කරනු ලැබීමෙන් එම පිරිවෙන්වල අධ්‍යාපනය ලද වියත් යතිවරයන් වහන්සේලා දිවයිනේ විවිධ ප්‍රදේශවල පිරිවෙන් ආරම්භ කිරීමත් සරණංකර සංඝරාජ මාහිමිපාණන් ආරම්භ කළ ධර්ම ශාස්ත්‍රීය ප්‍රබෝධය දිවයින පුරා ව්‍යාප්ත වීමට හේතු විය.


ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත්වීමත් සමඟ එම පාලකයන් විසින් භික්ෂූන් වහන්සේ හා ගිහි ජනතාව අතර තිබූ සම්බන්ධතාවය බිඳ දැමීමත්, මිෂනාරි පාසල් ආරම්භ කර රාජ්‍ය අනුග්‍රහය ලබාදීමත් ආදී ක්‍රියාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස ගුණදහමින් පිරිහුණු සිංහල බෞද්ධයන් සුරාව, සූදුව ආදී දුරාචාරයන්ට යොමු වීම සිදු විය. මෙම ව්‍යසනයෙන් සිංහල බෞද්ධයා රැක ගැනීමේ අවශ්‍යතාවය අවබෝධ කරගත් ගිහි පැවිදි වියතුන් කිහිප දෙනෙකු බිහිවීම බෞද්ධ ජනතාවගේ භාග්‍යයක්ම විය. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, රත්මලානේ ශ්‍රී ධම්මාලෝක නාහිමි, රත්මලානේ ශ්‍රී ධර්මාරාම නාහිමි, වස්කඩුවේ ශ්‍රී සුභූති නාහිමි, වැලිගම ශ්‍රී සුමංගල නාහිමි, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ආදී සංඝ පීතෘන් වහන්සේලා සහ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා, ශ්‍රීමත් වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමා ආදී බෞද්ධ ප්‍රභූහු බෞද්ධ ජනතාව අවදි කරවීමට කටයුතු කරන ලදි. ශ්‍රී ලංකාව තුළ මෙබඳු පසුබිමක් තිබියදී පානදුරාවාදයෙන් නැඟුණු ප්‍රතිරාවය විදේශයන්හිද පැතිර යෑමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ ඇමරිකන් ජාතික සෙන්පති හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාගේ ලංකාගමනය මෙරට බෞද්ධ පුනරුදයට මහත් පිටිවහලක් විය. ලංකාවේ ඉරුදින දහම්පාසල් ව්‍යාපාරයේ මූලබීජය හෙන්රි ස්ටීල් ඕල්කට් මැතිතුමාගේ සිත තුළ පහළ වූ බවට එතුමාගේ දිනපොතේ සටහන් කර ඇති පහත ප්‍රකාශය සාක්ෂි දරයි. “මගේ සිතට වැදගත් අදහසක් පහළ විය. බෞද්ධ ළමයින් ඔවුන්ගේ ආගම දිවයිනේ තිබෙන සෑම විහාරස්ථානයකදීම විශේෂ දින වල නියමිත පැය ගණනක් උගත යුතුය.”


හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා

මෙම අරමුණ අනුව ඕල්කට්තුමාගේ පුරෝගාමීත්වයෙන් ප්‍රථම ඉරුදින දහම් පාසල 1881 පෙබරවාරි 13 වන දින කොළඹ මැලිබන් වීදියේ පරම විඥානාර්ථ බෞද්ධ සමාගම් කාර්‍යාලයේ ආරම්භ කළ බව එම සමාගමේ සියවස් ප්‍රකාශනයේ සඳහන් වේ. ගුරු හිඟය නිසා එම දහම් පාසල අක්‍රිය වී ඇති අතර 1884 දී ආනන්ද විද්‍යාලයේ විදුහල්පති ලෙඩ්බීටර් මහතා විසින් නැවත ආරම්භ කරනු ලැබූවත් ටික කලකින් එයද අක්‍රිය වී ඇත. ඕල්කට්තුමාගේ සංකල්පයට අනුව 1895 අගෝස්තු මස 3 වැනි දින ගාල්ලේ වැලිවත්තේ විජයානන්ද විහාරස්ථානයේ පූජ්‍ය ඇහැලේපොල ජිනෝරස ස්වාමීන් වහන්සේගේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද විජයානන්ද දහම් පාසල සංවිධානාත්මකව විහාරස්ථානයක ආරම්භ වූ ප්‍රථම ඉරුදින දහම් පාසල වන හෙයින් නූතන දහම් අධ්‍යාපනයේ ආරම්භක අවස්ථාව ලෙස විජයානන්ද දහම් පාසල හැඳින්විය හැකිය. එක්දහස් නමසිය මුල් ගණන් වන විට දිවයින පුරා ඉරුදින දහම් පාසල් ව්‍යාපාරය ව්‍යාප්ත වී යෑමෙන් මෙරට ඇති වූ බෞද්ධ ප්‍රබෝධය ශක්තිමත් වීමට ඉරුදින දහම් පාසල ඉවහල් වූ බව පැහැදිලි වේ.


ශ්‍රී ලංකාවේ ප්‍රථම දහම් පාසල ඇරඹි ශ්‍රී විජයානන්ද පිරිවෙන් විහාරස්ථානය

ශ්‍රීමත් ඩී. බී ජයතිලක මැතිතුමාගේ සභාපතිත්වයෙන් 1889 දී ආරම්භ කරන ලද කොළඹ තරුණ බෞද්ධ සංගමය දහම් පාසල් අධ්‍යාපනයේ උන්නතිය සඳහා පුරෝගාමීව කටයුතු කළ සංවිධානයකි. 1920 දී දහම් පාසල් විභාග පැවැත්වීම තරුණ බෞද්ධ සංගමය මඟින් ආරම්භ කරන ලද අතර එතැන්සිට 1956 දක්වාත්, යළිත් 1978 සිට මෑතක් වන තුරුම ඔවුන් විසින් විභාගය පවත්වන ලදි. (මේ වන විට වර්ෂ අවසාන දහම් පාසල් විභාගය බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබයි.) දහම් පාසල්වලට අවශ්‍ය පෙළ පොත් සම්පාදනය කර ලබාදීමෙන්ද තරුණ බෞද්ධ සංගමය ඉටුකළ සේවාව ප්‍රශංසනීය ය.




*කොළඹ තරුණ බෞද්ධ සංගම් කාර්යාලය*

1956 දී සංස්කෘතික දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමත් සමගම ලංකාවේ ඉරුදින දහම් පාසල් ව්‍යාපාරයට රාජ්‍ය අනුග්‍රහය ලැබිණි. ලංකාවේ සියළුම දහම් පාසල් එම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ අතර ඒ පිළිබඳ වගකීම දෙපාර්තමේන්තුවට පැවරිණි. සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පදනම් කරගෙන ශාසනාරක්ෂක මණ්ඩල පිහිටුවීමත්, දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය හා බෞද්ධ ධර්මාචාර්ය විභාගය පවත්වා සහතික පත්‍ර ප්‍රදානය කිරීමත්, පෙළ පොත් සම්පාදනය කර බෙදාදීමත් නිසා දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳව උනන්දුව වර්ධනය වීම සිදු විය. තවද 1981 දී බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව නමින් නව දෙපාර්තමේන්තුවක් පිහිටුවීමත්, 1989 දී අභ්‍යාසලාභී ගුරුවරුන් බඳවා ගැනීමේදී දහම් පාසල් විභාග සහතික වලට විශේෂ ලකුණු ප්‍රදානය කිරීමත්, 1989 වසරේදී බුද්ධ ශාසන අමාත්‍යාංශය ස්ථාපනය කර ජනාධිපතිතුමා විෂය භාර අමාත්‍යවරයා වීමත් නිසා දහම් පාසල් අධ්‍යාපනයේ මහත් ප්‍රගතියක් ඇති විය.

2002 වර්ෂයේදී දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල ඒකාබද්ධ කර සමස්ථ ලංකා ශාසනාරක්ෂක බලමණ්ඩලය ස්ථාපනය කිරීමත් සහ බුද්ධ ශාසන අමාත්‍යාංශයේ සහ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන් වලට සමස්ථ ලංකා ශාසනාරක්ෂක බලමණ්ඩලයේ උපදේශකත්වය ලැබීමත් සමගම දහම් පාසල් අධ්‍යාපනය වඩාත් විධිමත් විය. දහම් පාසල් ගුරු පුහුණු වැඩමුළු දීපව්‍යාප්තව පැවැත්වීම, දහම් ගුරුවරුන් ලියාපදිංචි කර හැඳුනුම්පත් ලබාදීම, දහම් ගුරුවරුන්ට විශ්වවිද්‍යාල උපාධි ලබා ගැනීමට ඉවහල්වන පිරිදි දහම් සරසවි ඩිප්ලෝමා පාඨමාලාව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් ආරම්භ කිරීම, දහම් පාසල් පෙළ පොත් නව විෂය නිර්දේශයක් යටතේ සම්පාදනය කිරීම ඇරඹීම ආදී කාර්යයන් රාශියක් සමස්ථ ලංකා ශාසනාරක්ෂක බලමණ්ඩලයේ මඟපෙන්වීම යටතේ ක්‍රියාත්මක කරන ලදි.

වසර 124 කට ආසන්න දහම් පාසල් අධ්‍යාපන ඉතිහාසය දෙස බලන කල රාජ්‍ය අනුග්‍රහය ලැබීමෙන් පසු දහම් පාසල් අධ්‍යාපනයේ සීඝ්‍ර වර්ධනයක් සිදුව ඇත. 1982 දී දහම් පාසල් සිසුන්ට පෙළ පොත් ලබාදෙන අවස්ථාව වන විට හය ලක්ෂයකට සීමා වූ ශිෂ්‍ය සංඛ්‍යාව මේ වන විට විසි දෙලක්ෂය ඉක්මවා තිබීමෙන් සහ හය දහසක් වූ දහම් පාසල් සංඛ්‍යාව දස දහසකට ආසන්න තත්වයකට වර්ධනය වීමෙන් ඒ බව සනාථ වේ. එතැනින්ද නොනැවතී ශ්‍රී ලංකාවෙන් එතෙර විදේශ රටවල පවා ශ්‍රී ලංකාවේ දහම් පාසල් ව්‍යාපාරය බොහෝ සේ ප්‍රචලිත වී පවතී. එසේ වී ඇත්තේ ශ්‍රී ලංකාවෙන් බැහැරව විදෙස් ගතව ජීවත් වූවද, ලංකාවේ ඉපදී, විහාරස්ථානය සහ ස්වාමීන් වහන්සේ ඇසුරෙහි හැදී වැඩුණු, හදවතින් ශ්‍රී ලාංකික වූ ජනතාව දහම් පාසල් අධ්‍යාපනයේ වටිනාකම මොනවට අවබෝධ කරගෙන සිටීමත්, ඔවුන්ගේ දූවා දරුවන්ද එම ශ්‍රී ලාංකීය බෞද්ධ සංස්කෘතියේ ගුණ සුවඳ මධ්‍යයේ හැදී වැඩෙනු දැකීමට එම දෙමාපියන් තුළ පවත්නා දැඩි ආශාවත් නිසාමය. මෙකී පැතුම් මල්ඵල ගන්වමින් 2001 අප්‍රේල් මස 20 වන දින ඩුබායි හි ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍ර පරිශ්‍රයේදී ආරම්භ කරන ලද "අපේ දහම් පාසල" එදා පටන් අද වන විට දෙදහසක් පමණ ශ්‍රී ලාංකික දූ දරුවන්ගේ නැණ පහන් දල්වාලමින් ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් ලෙස මහත් යුග මෙහෙවරක යෙදෙමින් සිටී. එක් අධ්‍යයන වසරකදී පන්සියයකට අධික දූ දරුවන් පිරිසක්, තිහකට අධික ස්වේච්ඡා ඇදුරු මඬුල්ලක් සෙවණේ අකුරු කරනු ලබයි. මව්බිමෙන් බැහැරව දුරු කතරේ දිවි ගෙවන ලක් දූ දරුවන්, ගණඳුර දුරලන පුන්සඳ මෙන් ගුණ නැණ බෙලෙන් බබළවන්නට අපේ දහම් පාසලෙන් ඉටුවන මෙහෙය මෙතෙකැයි කියා නිම කළ නොහැක.

*ලිපි සැකසුම: යසිරු නවෝදන*

*මූලාශ්‍රය: බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත **"දහම් පාසල් කළමනාකරණය"** ග්‍රන්ථය.*

*ඩුබායි දහම් පාසල,*
*ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය,*